AL/2015/44/S-I

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2015 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2015 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2015

| | | |
|---|---|---|
| ඉස්ලාම් I<br>இஸ்லாம் I<br>Islam I | 44 S I | පැය දෙකයි<br>இரண்டு மணித்தியாலம்<br>Two hours |

**උපදෙස්:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
* උත්තර පත්‍රයේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
* **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (×) යොදා දක්වන්න.**

---

**1.** 'අල්ලාහ් අසීමිත ව ලබා දෙන්නෙකි' යන්න දක්වන ඔහුගේ ශුද්ධ වූ නාමය වනුයේ,
(1) අස් සලාම් ය. (2) අල් කාලික් ය. (3) අර් රස්සාක් ය. (4) අල් බාරි ය. (5) අර් රවුෆ් ය.

**2.** සබ්අ මසානි යන සූරාහ් ව
(1) අල් ෆාත්තිහා ය. (2) අල් ෆලක් ය. (3) අල් අහ්ලා ය. (4) අල් ලුහා ය. (5) අල් කහ්ෆු ය.

**3.** නබි (සල්) තුමා විසින් මක්කාවේ සිට මදීනාවට යවන ලද දූතයා වූයේ
(1) ජඃෆර් ඉබ්නු අබූතාලිබ් (රළි) ය.
(2) අබූමූසා අල් අෂ්අරි (රළි) ය.
(3) මුආද් ඉබ්නු ජබල් (රළි) ය.
(4) උසාමා බින් සෙයිද් (රළි) ය.
(5) මුස්අබ් බින් උමයිර් (රළි) ය.

**4.** ඉස්ලාමයේ ශුද්ධ වූ මස්ජිද තුනකි. ඒවා අතුරෙන් හිජාසයට පිටින් ඇත්තේ,
(1) මස්ජිදුල් අක්සා ය.
(2) මස්ජිදුන් නබවී ය.
(3) මස්ජිදුල් හරාම් ය.
(4) මස්ජිද් කුබා ය.
(5) මස්ජිද් කිබ්ලතයින් ය.

**5.** දෙවියන් නැතැ'යි තර්ක කරන්නෝ,
(1) මුෂ්රික් ය. (2) කාෆිර් ය. (3) මුනාෆික් ය. (4) මුල්හිද් ය. (5) මුර්තද් ය.

**6.** සලාතය ඉටු කළ යුතු ආකාරය දැන ගැනීම
(1) ෆර්ලු ය. (2) සුන්නත් ය. (3) වාජිබ් ය. (4) මුබාහ් ය. (5) ෂර්ත් ය.

**7.** සුබ්හ් සලාතයේ අදාන්හි ඇතුළත් "අස්සලාත්තු හයිරුන් මිනන්නව්ම්" යන්න මුලින් ම පැවසුවේ,
(1) උමර් (රළි) ය.
(2) අලි (රළි) ය.
(3) බිලාල් (රළි) ය.
(4) අබුබක්ර් (රළි) ය.
(5) අම්මාර් (රළි) ය.

**8.** 'බැඳීමක් නොමැති ජීවිතය' යන්න දක්වන වචනය
(1) රිලා ය. (2) වරහ් ය. (3) සුහ්ද් ය. (4) තවක්කුල් ය. (5) මහබ්බා ය.

**9.** හජ්හි හා උම්රාහි සිදුවන ක්‍රියාවලියක් වන්නේ,
(1) තවාෆ් කිරීම ය.
(2) අරෆාවේ රැඳී සිටීම ය.
(3) මිනාහි රැඳී සිටීම ය.
(4) ජම්රාවල ගල් ගැසීම ය.
(5) අදාළ කාලයේ පමණක් ඉටු කිරීම ය.

**10.** "කියාමාවේ දී මිනිසාගේ ක්‍රියාකාරකම් කිරනු ලැබේ." යන අදහස දැක්වෙන වචනය
(1) හිසාබ් ය. (2) මීසාන් ය. (3) සිරාත් ය. (4) හෂර් ය. (5) ලිවාඋල් හම්ද් ය.

**11.** එක් එක් පරම්පරාවේ දැනුම් දෙන්නන් අතුරෙන් රාවිවරුන් වැඩි දෙනකු විසින් දැනුම් දෙනු ලබන හදීස්
(1) මුතවාතිර් නම් වේ.
(2) ආහාද් නම් වේ.
(3) සහීහ් නම් වේ.
(4) හසන් නම් වේ.
(5) ලඊෆ් නම් වේ.

**12.** සබා රටේ රැජිනට ඉස්ලාමය වැළඳගන්නා ලෙස ඇරයුම් කළ නබිතුමා
(1) නූහ් (අලයි) තුමා ය.
(2) දාවුද් (අලයි) තුමා ය.
(3) සුලයිමාන් (අලයි) තුමා ය.
(4) ඉබ්රාහීම් (අලයි) තුමා ය.
(5) ඊසා (අලයි) තුමා ය.

**13.** ස්වාභාවික ජල සම්පාදනයෙන් සිදු කරන කෘෂිකර්මාන්තය සඳහා වන සකාත් ප්‍රමාණය
(1) $2\frac{1}{2}\%$ කි. (2) 5% කි. (3) 10% කි. (4) 15% කි. (5) 20% කි.

[දෙවැනි පිටුව බලන්න.

Department of Examinations, Sri Lanka

14. හිමිකාරත්වයේ දී අස්හාබුල් පුරුල්හි ඇතුළත් **නො වන** අය වනුයේ,
(1) සොයුරිය ය. (2) මව ය. (3) සීයා ය.
(4) එක් කුස උපන් සොයුරිය ය. (5) සැමියාගේ මව ය.

15. මුස්ලිම් විවාහ ලේකම්වරයකු තම දියණිය විවාහ කර දෙනු ලබන අවස්ථාවක දී ඔහු දරන භූමිකාව කුමක් ද?
(1) වකීල් (2) වලි (3) කාලි (4) ෂාහිද් (5) ඉමාම්

16. ඉමාම් මුස්ලිම් (රහ්) පහත සඳහන් කුමන කණ්ඩායමකට අයත් වේ ද?
(1) මුෆස්සීර්වරු (2) මුහද්දිස්වරු (3) මුජ්තහිද්වරු (4) රාවිවරු (5) කාරිවරු

17. මුස්ලිම්වරයෙක්, රෝගියකු මුණ ගැසුණු විට ප්‍රාර්ථනා කළ යුතු වන්නේ කෙසේ ද?
(1) ඉන්ෂා අල්ලාහ් (2) මාෂා අල්ලාහ් (3) ෂෆාකල්ලාහ්
(4) බාරකල්ලාහ් (5) ෆී අමානිල්ලාහ්

18. සුන්නත් වූ සව්මය ඉටු කරන අයියාමුල් බීල් දින ලැබෙනුයේ,
(1) අවුරුද්දකට වරකි. (2) අවුරුද්දකට දෙවරකි. (3) මසකට වරකි.
(4) මසකට දෙවරකි. (5) සතියකට වරකි.

19. පහත සඳහන් වචනවලින් කෘෂිකර්මයට පමණක් සම්බන්ධ වචනය
(1) ඉජාරා ය. (2) මුෂාරකා ය. (3) මුලාරබා ය. (4) මුසාරආ ය. (5) මුරාබහා ය.

20. "නිශ්ශබ්ද ව සිටීම එකඟතාවයේ ලක්ෂණයයි." යන අදහසින් පළ වූ ඉජ්මාව
(1) ඉජ්මා ෂරීහි ය. (2) ඉජ්මා කවුලී ය.
(3) ඉජ්මා අක්සරිය්යා ය. (4) ඉජ්මා ෆිඅලී ය.
(5) ඉජ්මා සුකූති ය.

21. "ලොව විනාශ වන තත්ත්වයක් ඇති වුව ද, තමා සතු ව ඇති බීජ සිටුවිය යුතු ය" යන්න පහත සඳහන් ඒවායින් කුමකට අදාළ වේ ද?
(1) කිලාෆත් (2) ඉබාදත් (3) ඉමාරත් (4) නසීහත් (5) අමානත්

22. "වෙළඳාම හා පොලිය සමාන නොවේ." මෙයට ප්‍රධාන හේතුව,
(1) වෙළඳාම හා පොලිය මුදල් හා සම්බන්ධ වීම ය.
(2) වෙළඳාමේ හා පොලියේ දෙන්නන් හා ගන්නන් සිටීම ය.
(3) වෙළඳාමේ හා පොලියේ ආදායම් ලැබීම ය.
(4) වෙළඳාමේ පාඩුවක් සිදු වුවත් පොලියේ පාඩුවක් සිදු නොවීම ය.
(5) ජාහිලියා යුගයේ වෙළඳාම හා පොලිය එකක් ලෙස සමාන ව සැලකීම ය.

23. 'මුවත්තා' අනන්‍ය වූ ග්‍රන්ථයක් වීමට හේතුව,
(1) එය මදීනාවේ දී ගොනුකරන ලද්දක් වීම ය.
(2) ඉමාම් මාලික්තුමා විසින් එය පහදා දෙනු ලැබීම ය.
(3) එය හදීස් ග්‍රන්ථයක් මෙන් ම ෆික්හ් ග්‍රන්ථයක් ද වීම ය.
(4) එයට විවරණ රැසක් ලියා තිබීම ය.
(5) එය ඉගෙන ගැනීම සඳහා කලීෆාවරු පවා මදීනාවට පැමිණීම ය.

24. අයකු තම පුතා විසින් ඝාතනය කරනු ලැබුවහොත්, එහි ප්‍රතිඵලය වන්නේ,
(1) මළ අයගේ දේපළින් 2/3 ක කොටසක් පුතාට ලැබීම ය.
(2) මළ අයගේ දේපළින් 1/3 ක කොටසක් පුතාට ලැබීම ය.
(3) මළ අයගේ දේපළින් පුතාට කොටසක් නොලැබීම ය.
(4) පියාගේ කොටසත් පුතාගේ කොටසත් රාජසන්තක වීම ය.
(5) පියාට කොටසක් ලැබෙන අතර පුතාට කොටසක් නොලැබීම ය.

25. මගීන් සමූහයෙක් තම ගමනේ දී සලාත කිහිපයක් එකතු කර හා කෙටි කර ඉටු කළහ. එහි දී ඔවුන් අනුගමනය කළ **වැරදි** ක්‍රමය කුමක් ද?
(1) ලුහර් හා අසර් සලාත එක්කොට ඉටු කිරීම
(2) ලුහර් හා අසර් සලාත කෙටිකොට ඉටු කිරීම
(3) මග්රිබ් හා ඉෂා සලාත එක්කොට ඉටු කිරීම
(4) මග්රිබ් හා ඉෂා සලාත කෙටිකොට ඉටු කිරීම
(5) සුබ්හ් සලාතය එක් නොකර හා කෙටි නොකර ඉටු කිරීම

26. නීති කෂේත්‍රයට දායකත්වය දැක්වූ ලාංකික මුස්ලිම් ප්‍රභූවරයා කවුද?
(1) ටී. බී. ජයා (2) බදිඋද්දීන් මහ්මූද් (3) එම්.ටී. අක්බර්
(4) ඒ. එම්. ඒ. අසීස් (5) අයි. එල්. එම්. අබ්දුල් අසීස්

27. විවිධ පුද්ගලයින් විසින් හදීස් කලාවේ 'අර්බඊන්' නම් හදීස් හතළිහක් ගොනු කර ඇත. ඔවුන් අතුරෙන් ප්‍රධාන වූයේ,
(1) ඉමාම් නවවී (රහ්) තුමා ය. (2) ඉමාම් තිර්මිදි (රහ්) තුමා ය.
(3) ඉමාම් බුහාරි (රහ්) තුමා ය. (4) ඉමාම් ඉබ්නු හජ්ර් (රහ්) තුමා ය.
(5) ඉමාම් අබු යහ්‍යා අල් මව්සිලි (රහ්) තුමා ය.



Department of Examinations, Sri Lanka
Department of Examinations, Sri Lanka

**28.** මෙවායින් **වැරදි** ප්‍රකාශය කුමක් ද?
(1) 'අල් ඉබාදත්' යනු අල්ලාහ් වෙනුවෙන් ගැත්තා ඉටු කරන නැමදුමකි.
(2) 'අල් තබ්ලීක්' යනු රසූල්වරුන්ගේ වාජිබ් වූ සිෆාත්වලින් එකකි.
(3) 'අල් හයියු' යනු අල්ලාහ්ට වාජිබ් වූ සිෆාත්වලින් එකකි.
(4) 'අල් ෆතානත්' යනු නබිවරුන්ට අදාළ මුස්තහිල් වූ සිෆාත්වලින් එකකි.
(5) 'මුඃජිසාත්' යනු නබිවරුන් දක්වන ආශ්චර්යයන් ය.

**29.** පහත සඳහන් කරුණු සලකා බලන්න.
A - සකාත් සමූහ වශයෙන් ලබා දිය යුතු ය.
B - මුස්ලිම් නොවන අයටත් සකාත් ලබා දිය හැකි ය.
C - සකාත් ක්‍රියාව වසර පුරා සිදු විය යුතු ය.
D - සකාත් ආයතනීකරණය කළ යුතු ය.
E - 'ෆිසබීලිල්ලාහ්' යන කොටස සහතික කළ යුතු ය.
ඉහත ප්‍රකාශවලින් සකාත් ලැබීමට සුදුස්සන් අතුරෙන් 'ආමිල්' යන අය ද අඩංගු වීමට අදාළ හේතු,
(1) A, B හා C වේ. (2) A, C හා D වේ. (3) B, C හා D වේ. (4) B, C හා E වේ. (5) B, D හා E වේ.

**30.** කුලෆා උර්රාසිදූන් පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.
A - සකීෆා බනීසා, ඉදා හි කලීෆාවරයා ලෙස තෝරා ගනු ලැබී ය.
B - අබූබක්ර් (රළි) තුමා තමන්ට පසුව කලීෆා ලෙස පත් කළේ ය.
C - කලීෆාවරයා වීමට සුදුසු යැයි සලකනු ලැබූ හය දෙනාගෙන් අයෙකි.
D - කවාරිජ්වරයකු විසින් ඝාතනය කරනු ලැබී ය.
E - එතුමා වෙනුවෙන් බෛඅතුර් රිල්වාන් සිදු විය.
F - නබි (සල්) තුමාගේ බෑනාවරුන්ගෙන් අයෙකි.
ඉහත ප්‍රකාශ අතුරෙන් උස්මාන් (රළි) හා සම්බන්ධ ප්‍රකාශ වනුයේ,
(1) A, B හා C ය. (2) A, C හා E ය. (3) C, D, හා E ය. (4) C, E හා F ය. (5) D, E හා F ය.

**31.** "යා අල්ලාහ්, ඔබ මොවුන්ගෙන් කවරෙකුට වැඩියෙන් කැමැත්තේ ද ඔහු ලවා මෙම ආගම දියුණු කරනු මැනවි" යැයි නබි (සල්) තුමා ප්‍රාර්ථනා කළේ ය. මෙහි මොවුන් යනුවෙන් කියැවෙන්නේ කවුරුන් ද?
(1) අම්ර් ඉබ්නු ආස් – කාලිද් ඉබ්නු වලීද් (2) අම්ර් ඉබ්නු හිෂාම් – උමර් ඉබ්නු කත්තාබ්
(3) උමර් ඉබ්නු කත්තාබ් – අම්ර් ඉබ්නු ජහ්ම් (4) අම්ර් ඉබ්නු හිෂාම් – අම්ර් ඉබ්නුල් ආස්
(5) උමර් ඉබ්නු අබ්දුල් අසීස් – උමර් ඉබ්නු කත්තාබ්

**32.** පහත සඳහන් ඒවායින් නවීන තෆ්සීර් දෙක වන්නේ,
(1) තෆ්සීර් ජලාලයින් හා අල් කෂ්ෂාෆ් ය. (2) අල් බහ්රුල් මුහීද් හා මපාතිහුල් ගෛබ් ය.
(3) අල් කාසීන් හා අල් ෆවුසුල් කබීර් ය. (4) ෆී ලිලාලිල් කුර්ආන් හා තෆ්හීමුල් කුර්ආන් ය.
(5) රූහුල් මආනි හා ජවාහිරුල් කුර්ආන් ය.

- අංක **33** සිට **37** දක්වා ප්‍රශ්නවලට අදාළ ව **X** හා **Y** යටතේ දී ඇති සමහර තොරතුරු කිසියම් ආකාරකින් එකිනෙකට සම්බන්ධතාවක් දක්වයි. ඒ අනුව **Y** තීරුවේ ඇති ඒවා, **X** තීරුවේ ඇති ඒවා සමඟ නිවැරදි අනුපිළිවෙළින් ගළපා ඇති පිළිතුර තෝරන්න.

**33.**

| X | Y |
|---|---|
| (i) හිජ්රි 80 | A – මාලික් ඉබ්නු අනස් (රළි) |
| (ii) හිජ්රි 93 | B – නුහ්මාන් බින් සාබිත් (රළි) |
| (iii) හිජ්රි 150 | C – මුහම්මද් බින් ඉස්මායිල් (රහ්) |
| (iv) හිජ්රි 194 | D – මුහම්මද් ඉබ්නු ඉද්රීස් (රහ්) |

(1) A, B, C, D (2) A, D, C, B (3) B, A, D, C (4) B, C, D, A (5) C, D, B, A

**34.**

| X | Y |
|---|---|
| (i) මූසා (අලයි) | A – නම්රූද් |
| (ii) දාවූද් (අලයි) | B – ෆිර් අවුන් |
| (iii) ඉබ්රාහීම් (අලයි) | C – අබූජහ්ල් |
| (iv) මුහම්මද් (සල්) | D – තාලූද් |

(1) A, B, C, D (2) B, C, A, D (3) B, D, A, C (4) C, A, D, B (5) D, B, A, C

**35.**

| X | Y |
|---|---|
| (i) අජා ඉබුල් හින්ද් | A – ඉමාම් ෂාෆිඊ |
| (ii) පුතුහුල් බුල්දාන් | B – ඉමාම් සුලයිමාන් ඉබ්නු අෂ්අද් |
| (iii) අර් රිසාලා | C – බලාදූරි |
| (iv) සුනන් අබී දාවූද් | D – ඉබ්නු ෂහ්රයාර් |

(1) A, B, C, D (2) B, C, D, A (3) C, D, A, B (4) D, C, A, B (5) D, B, A, C

[හතරවැනි පිටුව බලන්න.

Department of Examinations, Sri Lanka
Department of Examinations, Sri Lanka

**36.**

| X | Y |
|---|---|
| (i) මුස්ලිම්වරයකු අනිවාර්යයෙන් ම කළ යුතු වූ දන්දීම | A – වක්ෆු |
| (ii) පිනට දීම | B – සදකා |
| (iii) අල්ලාහ්ගේ තෘප්තිය පතා මහජනතාවට යමක් දීම | C – හදියා |
| (iv) තෑගි වශයෙන් දීම | D – සකාත් |

(1) A, B, C, D (2) B, C, D, A (3) C, D, A, B (4) D, A, B, C (5) D, A, C, B

**37.**

| X | Y |
|---|---|
| (i) ඉමාම් අබු හනීෆා (රහ්) | A – කූෆා |
| (ii) ඉමාම් අබු යූසුෆ් (රහ්) | B – බග්දාද් |
| (iii) ඉමාම් ෂාෆිඊ (රහ්) | C – නයිසාපූර් |
| (iv) ඉමාම් මුස්ලිම් (රහ්) | D – ගාසා |

(1) A, B, C, D (2) A, D, B, C (3) B, C, D, A (4) B, D, A, C (5) C, D, A, B

- අංක **38** සිට **41** දක්වා ප්‍රශ්නවලට අදාළ ව දී ඇති වචන අතුරෙන් කිසියම් ආකාරයක සම්බන්ධතාවක් සහිත වචන යුගල දෙකක් ඇත. එවැනි සම්බන්ධතාවක් **නොමැති** ඉතිරි වචනය තෝරන්න.

**38.** (1) අසර් (2) ලුහර් (3) විත්ර් (4) ලුහා (5) කුසූෆයින්

**39.** (1) අරෆා (2) සෆා (3) මර්වා (4) හජ්රුල් අස්වත් (5) රුක්නුල් යමානි

**40.** (1) අල් ඉජාරා (2) කර්ල් (3) රිබා (4) නෆකා (5) කිස්වා

**41.** (1) ඊලාඋ (2) ඉද්දා (3) ජිස්යා (4) ලිහාර් (5) උස්ර්

- අංක **42** සිට **50** දක්වා ප්‍රශ්නවලට අදාළ ව ප්‍රකාශ දෙකක් බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්න අංකයට අදාළ ව දී ඇති ප්‍රකාශ යුගලය සම්බන්ධයෙන් පහත සඳහන් (1), (2), (3), (4), (5) යන වරණවලින් වඩාත් ගැළපෙන යෙදුම් යුගලය සහිත වරණය තෝරා, එහි **අංකය** පිළිතුරු පත්‍රයේ සලකුණු කරන්න.

| වරණ අංකය | පළමු යෙදුම | දෙවැනි යෙදුම |
|---|---|---|
| (1) | නිවැරදි ය. | නිවැරදි ය. |
| (2) | වැරදි ය. | නිවැරදි ය. |
| (3) | නිවැරදි ය. | වැරදි ය. |
| (4) | වැරදි ය. | වැරදි ය. |
| (5) | නිවැරදි ය. | පළමු යෙදුම තවදුරටත් පැහැදිලි කරයි. |

| | පළමු ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| 42. | කලීෆා උමර් (රළි) හදීස් ග්‍රන්ථාරූඪ කරන මෙන් අණ කළේ ය. | සහීහ් වූ හදීස් ග්‍රන්ථ ඇති වීමට ඉමාම් ෂුහ්රි පුරෝගාමී වූයේ ය. |
| 43. | සහබාවරුන්ගේ කාලයේ ෆික්හ් තනි ක්ෂේත්‍රයක් ලෙස වර්ධනය විය. | ඉමාම් අබු හනීෆා ෆික්හ් ක්ෂේත්‍රයේ පුරෝගාමියා වූයේ ය. |
| 44. | මුහම්මද් (සල්) තුමා කුරයිෂිවරුන් සමඟ ඇති කර ගත් ගිවිසුම, හුදයිබිය්යා ගිවිසුම නම් වේ. | හුදයිබිය්යා ගිවිසුම මදීනාවේ දී ඇති කර ගන්නා ලදී. |
| 45. | කයිබර්හි මුස්ලිම්වරු හා රෝමවරු අතර සටන් ඇති විය. | මදීනා ශාසනය යනු නබි (සල්) තුමා සහ යුදෙව්වන් අතර ඇති වූ ගිවිසුමයි. |
| 46. | 'මද්රසතුල් රඋයු' නම් නීති අංශයක් මුල් කාලයේ මදීනාවේ තිබිණ. | ඉමාම් ෂාෆිඊ (රහ්) තුමා මද්රසතුල් අසර් යන නීති ක්ෂේත්‍රයේ ප්‍රධානියා විය. |
| 47. | ඉස්ලාමයේ මුල් කාලයේ රෝමවරුන් හා පර්සියානුවන් අතර දකුණු අරාබියේ දී ඇති වූ සටනින් පර්සියානුවන් ජයග්‍රහණය කළේ ය. ඊළඟ සටනේ දී රෝමවරුන් ජයග්‍රහණය කරනු ලබන බවට සූරතුල් රූම් විසින් අනාවැකියක් පළ කරන ලදී. | ක්‍රි. ව. 624 දී සිදු වූ යුද්ධයේ දී රෝමවරු පර්සියානුවන් පැරැද වූහ. |
| 48. | 'අෂ් අරිය්යා' යන අය සුන්නත් වල් ජමා අතයට අයත් අයයි. | කලීෆා මඃමූන් මුඃතසිලාවරුනට සහාය දැක්විය. |
| 49. | ඔබගේ භාෂා වෙනස් ව තිබීම දේව සාක්ෂිවලින් එකකි. | ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරු විවිධ භාෂා කතා කරන ජනයා සමඟ සුහද ව ජීවත් වෙති. |
| 50. | අකීදා අංශ බිහිවීමට ඓතිහාසික සිද්ධි හේතු විය. | අකීදා කොටස් ඇති වීමට සමහර කලීෆාවරුන් ද හේතු විය. |

* * *

Department of Examinations, Sri Lanka
Department of Examinations, Sri Lanka

AL/2015/44/S-II

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2015 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2015 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2015

ඉස්ලාම් II
இஸ்லாம் II
Islam II

44 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

**උපදෙස්:**

※ I කොටසින් ප්‍රශ්න **දෙකක්** ද, II කොටසින් ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

※ සෑම ප්‍රශ්නයකට ම ලකුණු **20** බැගින් හිමි වේ.

## I කොටස

1. නබි (සල්) තුමාගේ ජීවිතයේ පහත සඳහන් සිද්ධිවල වැදගත්කම දක්වන්න.
   (i) කතීජා (රළි) තුමිය විවාහ කර ගැනීම
   (ii) කඃබාවේ හජරුල් අස්වදය තැන්පත් කිරීම
   (iii) උමර් (රළි) තුමා ඉස්ලාමය වැළඳ ගැනීම
   (iv) බයිඅතුල් අකබා

2. පහත සඳහන් කරුණු පිළිබඳ ව පැහැදිලි කරන්න.
   (i) තලාක් පිළිබඳ ඉස්ලාමීය දෘෂ්ටිය
   (ii) තලාක් අනුමත කරනු ලබන අවස්ථා
   (iii) තලාක් වර්ග
   (iv) තලාක් නිසා පවුල තුළ ඇති වන බලපෑම්

3. පහත සඳහන් කරුණු පිළිබඳ ව පහදන්න.
   (i) වෙළෙඳාම වලංගුවීමට අදාළ නීති
   (ii) හජ්හි ෆර්ල් හා වාජිබ්
   (iii) තස්කියතුන් නෆ්ස්
   (iv) අල්-කුර්ආනයේ විශ්මිතයන්

## II කොටස

4. (i) අරාබි ජාතිකයන් ලංකාවට පැමිණීම කෙරෙහි බලපෑ කරුණු පැහැදිලි කරන්න.
   (ii) ආරාබි ජාතිකයන්ගේ පැමිණීම නිසා ඇති වූ ප්‍රතිඵල විස්තර කරන්න.

5. පහත දැක්වෙන කරුණු පිළිබඳ ව විස්තර කරන්න.
   (i) ලෝක අවසානයේ දක්වන මහා ලක්ෂණ
   (ii) තහනම් කරන ලද ආහාර වර්ග

6. පහත සඳහන් කරුණු පිළිබඳ ව විස්තර කරන්න.
   (i) හුකුකුල් ඉබාද්
   (ii) ඉස්ලාමයේ දැක්වෙන ජාතීන් අතර සංහිඳියාව

7. ඉමාම් බුහාරි (රහ්) තුමා පිළිබඳ ව පහත සඳහන් මාතෘකා යටතේ විස්තර කරන්න.
   (i) ඉමාම් බුහාරි (රහ්) තුමාගේ ජීවිත කතාව කෙටියෙන්
   (ii) හදීස් ක්ෂේත්‍රයට එතුමාගෙන් වූ සේවාව

8. (i) අපරාධ වැළැක්වීමට ඉස්ලාම් අනුගමනය කරන ක්‍රමෝපා මොනවා ද?
   (ii) ඉහත (i) ට අදාළ ව ඔබ සඳහන් කළ ක්‍රමෝපා වඩාත් සුදුසු බවට හේතු දක්වන්න.

* * *

Department of Examinations, Sri Lanka
Department of Examinations, Sri Lanka

Department of Examinations, Sri Lanka
Department of Examinations, Sri Lanka